# උව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# ஊவா மாகாண கல்வித் திணைக்களம்
# Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
**General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024**

| | | | | | |
|---|---|---|---|---|---|
| 13 ශ්‍රේණිය | 23 | S | I | දේශපාලන විද්‍යාව I<br>Political Science I | කාලය : පැය දෙකයි<br>Time : Two hours |

**උපදෙස් :**

- මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ.
- A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් සහ B කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20 කින් යුක්ත වේ.
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වේ.
- එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 100 කි.

## A කොටස

- අංක 01 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

01. දේශපාලනය,
   (1) ප්ලේටෝ හා ඇරිස්ටෝටල් මෙහි ආරම්භකයෝ ය.
   (2) ග්‍රීක යුගයේ ආරම්භ වී වර්ධනය වී ඇත.
   (3) සමාජයේ සදාචාරාත්මක ඇගයුම් අධ්‍යයනය කරයි.
   (4) පුළුල් වූත් ගතිකවූත් සමාජය තුළ අධ්‍යයනය කරයි.
   (5) පෞද්ගලික පරිමණ්ඩලයට අයත් කාර්යයකි. (..........)

02. දේශපාලන විද්‍යාවේ අධ්‍යයන ප්‍රවේශ සම්බන්ධව වඩාත් නිවැරදි වන්නේ,
   (1) ස්ත්‍රීවාදී ප්‍රවේශය ස්ත්‍රී පුරුෂ සමාජභාවය බැහැර කරයි.
   (2) බහු විෂයක ප්‍රවේශය දේශපාලන විද්‍යා විෂය හුදකලා විෂයක් බවට යෝජනා කරයි.
   (3) දාර්ශනික ප්‍රවේශය ආනුභවික පර්යේෂණ මගින් නිගමන වලට පැමිණේ.
   (4) චාර්යාවාදී ප්‍රවේශය සදාචාරාත්මක අගය කිරීම් වලින් තොර වේ.
   (5) අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය ධනපති රාජ්‍ය ක්‍රමය අගය කරයි. (..........)

03. ෆැසිස්ට්වාදය,
   (1) රාජ්‍ය හා ජාතිය සර්වසම තත්ත්වයට පත් කර ඇත.
   (2) බලයේ හිමිකරුවා මහජනතාව බව දක්වයි.
   (3) අත්‍යන්ත රණවාදය ප්‍රතික්ෂේප කරයි.
   (4) පුද්ගල යහපත අරමුණ කර ගනී.
   (5) ප්‍රජාතන්ත්‍රවාදී අගය කිරීම් මත පදනම් වේ. (..........)

04. ඒකීය රාජ්‍යය,
   (1) නිරතුරුවම විමධ්‍යගතකරණය ප්‍රවර්ධනය කරයි.
   (2) විෂම ජාතිය සමාජවලට වඩාත් යෝග්‍ය වේ.
   (3) සුළුතර ජනවාර්ගික ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීමට ඇති හැකියාව සනාථ කරයි.
   (4) අනගිභවනීය බලතල සහිත මධ්‍යම ආණ්ඩුවකින් සමන්විත වේ.
   (5) ගෝලීයකරණයෙන් එල්ලවන බලපෑමෙන් නිදහස් ය. (..........)

05. දේශපාලන පක්ෂ,

(1) බහු පක්ෂ ක්‍රමයක් යටතේ ස්ථාවර ආණ්ඩු බිහි වේ.

(2) සමාජවාදී ක්‍රමයක තරඟකාරී පක්ෂ ක්‍රමයක් පවතී.

(3) මහජනයා හා ආණ්ඩුව එකට සම්බන්ධ කරන ප්‍රධානතම මෙවලම වේ.

(4) මැතිවරණ මගින් පමණක් බලය ලබා ගනී.

(5) ද්වි පක්ෂ ක්‍රමයක් තුළ පක්ෂ දෙකක් පමණක් දක්නට ලැබේ. (..........)

06. ගැටුම් සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,

(1) ගැටුම් හැම විටම නිශේධනීය ප්‍රතිඵල ඇති කරයි.

(2) ගැටුම් පැන නගින්නේ පාර්ශවකරුවන් අතර සමනය කළ නොහැකි අරමුණු නිසාය.

(3) මිනිසුන්ගේ සමාජ ජීවිතයට කිසිසේත් අදාළ නොවේ.

(4) සහමන්ත්‍රණය සිදුවන ආකාර දෙකක් වේ.

(5) සරළ වැළැක්වීමේ දී ගැටුමට මූලහේතු සොයා ඒවාට විසඳුම් ලබා දේ. (..........)

07. පශ්චාත් යටත් විජිත රාජ්‍යය,

(1) විශාල භෞමික රාජ්‍යය බවට පත් විය.

(2) යටත් විජිත පාලනයෙන් ලැබුණු දේශපාලන නිදහස එම ව්‍යුහවලින් කැඩී වෙන් වී නොමැත.

(3) ආණ්ඩු පාලනයට පමණක් සීමා වී ඇත.

(4) වේගයෙන් ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තනයන්ට අනුව සැකසුණි.

(5) දුර්වල හා ශක්තිමත් නොවූ මිලිටරි හා සිවිල් නිලධර ව්‍යුහයක් ඇති විය. (..........)

08. සීමිත ආණ්ඩුව යනු,

(1) පරමබලවාදය වේ.

(2) නීතියේ පාලනය නොව මිනිසුන්ගේ පාලනය වේ.

(3) නෛතික සීමාවලින් තොරව පාලනය වේ.

(4) අපේක්ෂා කරන්නේ ''පුද්ගල නිදහස'' ඇති කිරීම වේ.

(5) පාලකයන් සතු අසීමිත බලය අදහස් වේ. (..........)

09. ප්‍රංශයේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මාදිලිය,

(1) විමධ්‍යගතවාදයට වඩා මධ්‍යගතවාදය වෙත යොමු වූ ආණ්ඩුක්‍රම මාදිලියකි.

(2) සම්භාව්‍ය සන්ධීය රාමුවෙන් ඔබ්බට ගමන් කරන මාදිලියකි.

(3) අර්ධ සන්ධීය මාදිලියට අයත් වේ.

(4) එය සහ සන්ධීය ක්‍රමයකි.

(5) ඒකීය මධ්‍යගත රාමුවෙන් ඔබ්බට ගමන් කරන මාදිලියකි. (..........)

10. ඇමරිකානු ආණ්ඩුක්‍රම මාදිලිය,

(1) සන්ධීය ආණ්ඩුක්‍රමයක් බව ව්‍යවස්ථාව තුළ ලිඛිතව සඳහන් කර නැත.

(2) ව්‍යවස්ථාව සංශෝධනය සඳහා ප්‍රාන්තවල අනුමැතිය අවශ්‍ය නොවේ.

(3) ''මහජන පරමාධිපත්‍යය'' යන සිද්ධාන්තය මත පදනම් විය.

(4) මෙය පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයකි.

(5) ක්‍රමයෙන් සහසන්ධීය ක්‍රමයක් ලෙස පරිවර්තනය වෙමින් පවතී. (..........)

11. ශ්‍රී ලංකාව 1978 ව්‍යවස්ථාවේ සිදු කළ 13 වන සංශෝධනය මඟින්,
   (1) ජාතික ආරක්ෂාව හැර සෙසු බලතල විමධ්‍යගත කිරීමට ප්‍රතිපාදන සලසා ඇත.
   (2) අවශේෂ බලතල පළාත් සභාවලට පවරා දීමට විධි විධාන සලසා ඇත.
   (3) පළාත තුළ හදිසි අවස්ථාවක් ප්‍රකාශ කිරීමට ආණ්ඩුකාරවරයාට බලතල දෙන ප්‍රතිපාදන සලසා ඇත.
   (4) පළාත් පාලන ආයතන සම්බන්ධ අධීක්ෂණ බලතල පළාත් සභාවලට පවරා දීමට විධි විධාන සලසා ඇත.
   (5) ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයා විසින් ආණ්ඩුකාරවරයා පත් කිරීමට විධි විධාන සලසා ඇත.

(..........)

12. ඉන්දියානු නිරාගමිකවාදයෙන් අදහස් කරන්නේ,
   (1) සෑම ආගමක් ම රාජ්‍ය ආගම් ලෙස සැලකීමයි.
   (2) රාජ්‍ය සියලු ආගම් වලට අපක්ෂපාතීව සැලකීමයි.
   (3) සියලු පුරුවැසියන්ගේ ජනවාර්ගික අනන්‍යතාවලට ගරු කිරීමයි.
   (4) සුළුතර ආගම් වලට විශේෂ සැලකිලි දැක්වීමයි.
   (5) ආගමික ඉගැන්වීම සම්බන්ධ මතභේද විසඳීමට ආණ්ඩුව මැදිහත් වීමයි. (..........)

13. බලතල බෙදීමේ සංකල්පය,
   (1) සන්ධීයගත රාජ්‍යයක මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත අතර බලය බෙදීම අදහස් වේ.
   (2) ඒකීය ආණ්ඩු ක්‍රමයක් තුළ මධ්‍යම ආණ්ඩුව සහ පළාත් පාලන ආයතන අතර බලය බෙදීම වේ.
   (3) ආණ්ඩුවේ ආයතන අතර බලය බෙදීම වේ.
   (4) මෙමගින් ප්‍රජාපීඩක පාලනයකට මඟ පාදයි.
   (5) ආණ්ඩුවේ කාර්යයන් එකිනෙකට සම්බන්ධ විය යුතු බව අදහස් කරයි. (..........)

14. ව්‍යවස්ථානුකූලවාදයෙන් අදහස් කරන්නේ,
   (1) පාලකයා නීතියට ඉහළින් සිටි යුතු බවයි.
   (2) ව්‍යවස්ථාවකින් තොරව කරන පාලනය වේ.
   (3) ෆැසිස්ට්වාදී මතවාදයේ ප්‍රධාන ලක්ෂණයකි.
   (4) ආචාරධර්ම මත කෙරෙන පාලනය වේ.
   (5) පටු හා පුළුල් යනුවෙන් අර්ථ දෙකකින් යුක්ත වේ. (..........)

15. කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ මගින් ඇති වූ ප්‍රතිඵලයක් වූයේ,
   (1) ද්විත්ව පාලනයක් ඇති කිරීමය.
   (2) දේශීය කෘෂි ආර්ථිකය නඟා සිටුවීම.
   (3) සීමිත ඡන්ද බලය ප්‍රදානය කරන ලදි.
   (4) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ ආරම්භක පදනම දමන ලදි.
   (5) ආණ්ඩුකාරවරයාගේ බලතල වර්ධනය කරන ලදි. (..........)

16. සම්භාව්‍ය වෙස්මිනිස්ටර් ආණ්ඩුක්‍රම ආකෘතියේ ලක්ෂණයක් නොවන්නේ,
   (1) ආණ්ඩුක්‍රම ව්‍යුහය තුළ පාර්ලිමේන්තුවට කේන්ද්‍රීය ස්ථානයක් හිමි වීමය.
   (2) විධායකය පාර්ලිමේන්තුවට වගකීමය.
   (3) පනත් පිළිබඳ විවරණ බලය අධිකරණය සතු වීමය.
   (4) ද්වි පක්ෂ ක්‍රමයක් පැවතීමය.
   (5) ව්‍යවස්ථාදායකය ද්විමාණ්ඩලික වීමය. (..........)

17. දේශපාලන මතවාදයක් ලෙස සමූහාණ්ඩුවාදය,
   (1) රාජාණ්ඩුවාදය අගය කරයි.
   (2) රාජ්‍යයේ සාමාජිකයා පුරවැසියා ලෙස සලකයි.
   (3) නිදහස යනු නිසර්ගයෙන්ම අහෝසි වීමේ තර්ජනයට මුහුණපාන පොදු අයිතියක් බව දක්වයි.
   (4) රාජ්‍ය නායකයා ජනතාවට වගකිව යුතු නැත යන්න.
   (5) බාධාවලින් තොරව ලැබෙන නිදහස වේ. (..........)

18. ගෝත්‍රික රාජ්‍ය සම්බන්ධයෙන් අදාළ නොවන්නේ,
   (1) කණ්ඩායම් ජ්‍යෙෂ්ඨත්වය අනුව නායකත්වය පැවරේ.
   (2) දේශපාලන ව්‍යුහයක් හෝ දේශපාලන ආයතන පවතී.
   (3) පාලන බලතල සමාජය තුළ විසිර පැවතිණි.
   (4) නායක පවුල මෙන්ම සියලු පවුල් තත්වයෙන් එක සමානය.
   (5) ආහාර හා අනෙකුත් අවශ්‍යතා සම්බන්ධයෙන් මෙම සමාජ ස්වයංපෝෂිත වේ. (..........)

19. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ මූලික ලක්ෂණයක් නොවන්නේ,
   (1) දිවයිනේ පළාත් වලට ප්‍රථම වරට ව්‍යවස්ථාපිත තත්ත්වය ලබා දෙන ලදි.
   (2) මෙමගින් රාජ්‍යයේ පැරණි ස්වභාවයෙන් අපගමනයක් සිදු විය.
   (3) පළාත් ප්‍රධාන අමාත්‍යවරයා මධ්‍යම ආණ්ඩුවේ නියෝජිතයා ලෙස ක්‍රියා කරයි.
   (4) සංවෘත ලැයිස්තුවේ බලතල ක්‍රියාත්මක කිරීම මධ්‍යම ආණ්ඩුවට පමණක් හිමි වේ.
   (5) පළාත් සභා වලට ප්‍රඥප්ති සෑදීමේ බලය තිබුණ ද ඒවා සීමාවන්ට ලක් කොට ඇත. (..........)

20. ඉන්දියානු සන්ධීය ක්‍රමයේ විශේෂ ලක්ෂණයක් වන්නේ,
   (1) ඉන්දියානු රාජ්‍යයේ ඇති සන්ධීයත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඍජුවම ප්‍රකා ශ කර ඇත.
   (2) ව්‍යවස්ථාව මගින් ප්‍රාන්ත ස්ථාපිත කොට, එමඟින් ප්‍රාන්ත හා මධ්‍යම ආණ්ඩුව අතර බලය බෙදා ඇත.
   (3) ව්‍යවස්ථාව නිර්මාණය කරන විට එහි ඒකීය ලක්ෂණ මතු කර ඇත.
   (4) ප්‍රාන්ත විසුරුවා හැරීමට මධ්‍යම රජයට බලය නැත.
   (5) වර්තමාන ඉන්දියාවේ ෆෙඩරල් ලක්ෂණ ශක්තිමත් වී නැත.

- අංක **21** සිට **25** දක්වා ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරන්න.

21. 1924 ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මගින්,
   (A) ආණ්ඩුකාරවරයාගේ බලතල පුළුල් ලෙස කප්පාදු කරන ලදි.
   (B) ව්‍යවස්ථාදායක සභාවේ සංයුතිය පුළුල් කරන ලදි.
   (C) ව්‍යවස්ථා සභාවේ නිල නොලත් සාමාජිකයන්ගේ බලතල වැඩි කරන ලදි.
   (D) නිල නොලත් සාමාජික සංඛ්‍යාව වැඩි කරන ලදි.
   (E) සීමිත ඡන්ද බලය හඳුන්වා දෙන ලදි.

   (1) A B C D  (2) B C D E  (3) A B D E
   (4) A C D E  (5) A B C E

22. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ අමාත්‍ය මණ්ඩලය,
   (A) සජාතීය සංගතයක් විය.
   (B) සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත විය.
   (C) සාමූහික වගකීමකින් තොරව ක්‍රියාත්මක විය.
   (D) මහලේකම් වරයාගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක විය.
   (E) වාර්ෂික අයවැය සහ අනෙකුත් මුදල් කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට වගකිව යුතු විය.

   (1) A B C D  (2) B C D E  (3) A B D E
   (4) A C D E  (5) A B C E

23. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,

(A) විධායක කාරක සභා ක්‍රමය මත ගොඩනැඟී තිබුණු ආණ්ඩු ක්‍රමය අහෝසි කොට කැබිනට් ආණ්ඩු ක්‍රමය හඳුන්වා දුන්නේ ය.

(B) පූර්ණ ඩොමීනියන් තත්ත්වය ප්‍රදානය නොකළ අතර ප්‍රදානය කළේ අභ්‍යන්තර කරුණු සම්බන්ධයෙන් නිදහස පමණි.

(C) බ්‍රිතාන්‍ය රැජිණ ලංකාවේ රාජ්‍ය නායක තනතුරෙහි තව දුරටත් තබා ගත්තේ ය.

(D) අධිකරණ ඇමති සෙනෙට් සභාවෙන් තෝරාගත යුතු බවට නියම කළේ ය.

(E) අධිකරණ කටයුතු සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය ප්‍රිවිකවුන්සිලයට අභියාචනා කිරීමට ලාංකිකයන් භුක්ති වින්ද අයිතිය අහෝසි කළේය.

(1) A B C D (2) B C D E (3) A B D E
(4) A C D E (5) A B C E

24. ප්‍රංශයේ වර්තමාන ආණ්ඩුක්‍රම මාදිලිය,

(A) ජනාධිපතිවරයා ඡන්ද විද්‍යාලයකින් තෝරා පත් කර ගැනේ.

(B) පරිපාලන විමධ්‍යගතකරණය ප්‍රාදේශීය ආණ්ඩුකරණයේ මූලික ලක්ෂණයකි.

(C) අමාත්‍යවරු ව්‍යවස්ථාදායකයේ සාමාජිකයෙක් නොවෙති.

(D) ආණ්ඩුක්‍රමය ඒකීය හා මධ්‍යගත වේ.

(E) වෙස්මිනිස්ටර් මාදිලිය සමඟ සැසඳීමේ දී අග්‍රාමාත්‍යවරයාගේ බලය සීමා සහිත වේ.

(1) A B C D (2) A B C E (3) A B D E
(4) A C D E (5) B C D E

25. ජාත්‍යන්තර දේශපාලනය

(A) ප්‍රධාන ක්‍රියාධරයන් දෙදෙනෙකුගෙන් යුක්ත විය.

(B) අන්තර්ජාතික රාජ්‍ය සංවිධාන රාජ්‍ය ක්‍රියාධරයන් ගණයට වැටේ.

(C) එය අවිධිමත් අරාජික වේ.

(D) වර්තමානය වන විට එය බහුධ්‍රැවීය ලෝක ක්‍රමයක් බවට පත් වී ඇත.

(E) මානව හිමිකම් ''ඇස'' සංවිධානය රාජ්‍ය ක්‍රියාධරයන් ගණයට වැටේ.

(1) A B C D (2) A B C E (3) A B D E
(4) A C D E (5) B C D E

- අංක **26** සිට **30** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) සහ (5) යන වර්ණවලින් කවර වරණය දැයි තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවෙනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවෙනි ප්‍රකාශය |
|---|---|---|
| 26. | 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඇති කළ ජාතික රාජ්‍ය සභාවට සියලු ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල සියල්ල ඒකරාශි වී ඇත. | ආණ්ඩුක්‍රමය තුළ බ්‍රිතාන්‍ය රැජිණගේ නායකත්වය එසේම රඳවාගනු ලැබීය. (..........) |
| 27. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වැනි සංශෝධනයට අනුව පාර්ලිමේන්තු සභාවක් ස්ථාපිත කොට ඇත. | 17 වැනි සංශෝධනයෙන් ඉහළ රාජ්‍ය නිලධාරීන් පත් කිරීමට ජනාධිපතිවරයාට තිබූ අභිමතානුසාරී බලය සීමා කෙරුණි. (..........) |
| 28. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනමතවිචාරණ කැඳවීමේ බලය ඇත්තේ ජනාධිපතිවරයාටයි. | 19 වන සංශෝධනයට අනුව පාර්ලිමේන්තුව ප්‍රතික්ෂේප කරන ලද පනතක් ජනමත විචාරණයට යොමු කිරීමට ජනාධිපතිට තිබූ බලය අහෝසි විය. (..........) |
| 29. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ජීවත් වීමේ අයිතිය ප්‍රකාශිතවම සහතික කර ඇත. | මූලික අයිතිවාසිකම් පිළිබඳ පෙත්සම් විමර්ශනය කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා නැත. (..........) |
| 30. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඇති කළ පාර්ලිමේන්තුව මන්ත්‍රීන් 225 න් සමන්විත වේ. | එයින් 196 දෙනෙකු සමානුපාතික නියෝජන ක්‍රමයට අනුව තෝරා ගනියි. (..........) |

## B කොටස

31. විද්‍යාත්මක (චර්යාවාදී) අධ්‍යයන ප්‍රවේශයේ මූලධර්ම දෙකක් ලියන්න.,
    1. ..........................................................................................................................
    2. ..........................................................................................................................

32. සිවිල් සමාජය යන්නට අර්ථ දෙකක් ලියන්න.
    (1) ..........................................................................................................................
    (2) ..........................................................................................................................

33. කෘත්‍යවාදී වර්ගීකරණයට අයත් ගැටුම් දෙයාකාර වේ. ඒවා මොනවාද?
    (1) ..........................................................................................................................
    (2) ..........................................................................................................................

34. ලිබරල්වාදී සංකල්පයේ මූලික ඇඟවීම් දෙකක් ඇත. ඒවා ලියන්න.
    (1) ..........................................................................................................................
    (2) ..........................................................................................................................

35. (1). ඒකීය හා සන්ධීය ආණ්ඩුක්‍රමවල ලක්ෂණ මිශ්‍රව ඇති ආණ්ඩු ක්‍රමය කුමක් ද?

....................................................................................................................................

....................................................................................................................................

(2). ස්වාධීන රාජ්‍ය ඒකක අතර සමීප සහයෝගයක් ඇති කර ගැනීමට, ඒවායේ එකඟතාවය මත ගොඩනගා ගෙන ඇති ආණ්ඩු ක්‍රමය කුමක් ද?

....................................................................................................................................

....................................................................................................................................

36. (1). ප්‍රථම වරට වාර්ගික නියෝජනය ක්‍රියාත්මක කළ ආණ්ඩු ක්‍රමය කුමක් ද?

....................................................................................................................................

....................................................................................................................................

(2). ලංකාවට සර්වජන ඡන්ද බලය හිමි වූ ආණ්ඩු ක්‍රමය කුමක් ද?

....................................................................................................................................

....................................................................................................................................

37. දේශපාලන න්‍යාය ආකාර දෙකකි. ඒ මොනවාද?

(1) ....................................................................................................................................

(2) ....................................................................................................................................

38. ජාතිකවාදය මතවාදයක් මෙන්ම දේශපාලන ව්‍යාපාරයක් ලෙස ප්‍රධාන ස්වරූප දෙකකි. ඒ මොනවාද?

(1) ....................................................................................................................................

(2) ....................................................................................................................................

39. නූතන රාජ්‍ය විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්ක කරන්නා වූ ක්‍රමවේද දෙකක් ලියන්න.

(1) ....................................................................................................................................

(2) ....................................................................................................................................

40. දැනට ලංකාවේ පවතින පැරණිතම දේශපාලන පක්ෂ දෙක ලියන්න.

(1) ....................................................................................................................................

(2) ....................................................................................................................................

41. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මූලික අයිතිවාසිකම් ක්‍රියාවට නැංවීම සඳහා යොදාගත හැකි යාන්ත්‍රණ දෙකක් ලියන්න.

(1) ....................................................................................................................................

(2) ....................................................................................................................................

42. ෆැසිස්ට්වාදි නිර්වචන අතරින් වඩාත් කැපී පෙනෙන නිර්වචන දෙක ලියන්න.

(1) ....................................................................................................................................

(2) ....................................................................................................................................

43. (1). පශ්චාත් යටත් විජිත රාජ්‍ය පිළිබඳ න්‍යායික සංකල්පය ඉදිරිපත් කළේ කවුද?

.......................................................................................................................................

(2). බලතල බෙදීමේ සංකල්පය ඉදිරිපත් කළේ කවුද?

.......................................................................................................................................

44. ස්ත්‍රීවාදය මගින් දේශපාලන විද්‍යාවට එක් කළ සංකල්පමය ප්‍රභේද 2 ක් ලියන්න.

(1) .......................................................................................................................................

(2) .......................................................................................................................................

45. මැතිවරණ ක්‍රමය මගින් ආරක්ෂා කළ යුතු නිර්ණායක දෙකක් ලියන්න.

(1) .......................................................................................................................................

(2) .......................................................................................................................................

46. නිලබල සංවිධානයක ප්‍රධාන ලක්ෂණ දෙක ලියන්න.

(1) .......................................................................................................................................

(2) .......................................................................................................................................

47. 1978 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය වීමට බලපෑ සාධක දෙකක් ලියන්න.

(1) .......................................................................................................................................

(2) .......................................................................................................................................

48. ශ්‍රී ලංකාව සාමාජිකත්වය ලබාගෙන ඇති කලාපීය රාජ්‍ය සංවිධාන දෙකක් ලියන්න.

(1) .......................................................................................................................................

(2) .......................................................................................................................................

49. ඒකීය රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ දෙකක් ලියන්න.

(1) .......................................................................................................................................

(2) .......................................................................................................................................

50. ඇමරිකානු එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩු සතු බලතල දෙකක් ලියන්න.

(1) .......................................................................................................................................

(2) .......................................................................................................................................

***

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024

| 13 ශ්‍රේණිය | 23 S II | දේශපාලන විද්‍යාව II<br>Political Science II | කාලය : පැය තුනයි<br>Time : Three hours |
|---|---|---|---|

අමතර කියවීම් කාලය : මිනිත්තු 10 යි.

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස් :**

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විතය.
- I කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද, II කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, III කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

(1). "සමාජයෙහි පවත්නා දේශපාලන බලයේ කේන්ද්‍රීය ප්‍රකාශනය රාජ්‍යය වේ". පැහැදිලි කරන්න. (ලකුණු 20)

(2). විද්‍යාත්මක (චර්යාවාදි) අධ්‍යයන ප්‍රවේශය විස්තර කරන්න. (ලකුණු 20)

(3). ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදි හා සමාජවාදි රාජ්‍ය මාදිලි අතර වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 20)

## II කොටස

(4). ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදි වර්ධනයට ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ විසින් සිදු කරන ලද දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

(5). සෝල්බරි පාර්ලිමේන්තුවේ හා 1972 ජාතික රාජ්‍ය සභාවේ නීති සම්පාදන බලය සංසන්දනය කරන්න. (ලකුණු 20)

(6). 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පහත මාතෘකා සාකච්ඡා කරන්න.
  (1) ජනාධිපතිවරයා පත් කරන ආකාරය
  (2) ජනාධිපතිවරයා ඉවත් කරන ආකාරය

(ලකුණු 10 x 2 = 20)

(7). (i) 1978 ආණ්ඩු ක්‍රමය යටතේ ඇති කළ පාර්ලිමේන්තුවේ බලතල හා කාර්යයන් පැහැදිලි කරන්න.
  (ii) 1978 ආණ්ඩුක්‍රමය යටතේ ඇති කළ සමානුපාතික නියෝජන ක්‍රමයේ වාසි අවාසි පැහැදිලි කරන්න.

## III කොටස

(8). වර්තමාන බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය එහි සාම්ප්‍රදායික ඒකීය මාදිලියෙන් ඈත් වී ඇත. පැහැදිලි කරන්න.

(9). ජාත්‍යන්තර දේශපාලනයේ ක්‍රියාධරයෝ පැහැදිලි කරන්න.

(10). පහත මාතෘකා වලින් දෙකක් පැහැදිලි කරන්න.
  (i) 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය
  (ii) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදි රාජ්‍යයක ලක්ෂණ.
  (iii) සීමිත ආණ්ඩුව
  (iv) සිවිල් සමාජය
  (v) ගැටුම් වර්ගීකරණය
  (vi) නිරාගමිකවාදය

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024

13 ශ්‍රේණිය | 23 | දේශපාලන විද්‍යාව Political Science

# පිළිතුරු පත්‍රය

## A කොටස

| | | |
|---|---|---|
| (1) 4 | (11) 4 | (21) 2 |
| (2) 4 | (12) 2 | (22) 2 |
| (3) 1 | (13) 3 | (23) 1 |
| (4) 4 | (14) 5 | (24) 3 |
| (5) 3 | (15) 4 | (25) 1 |
| (6) 2 | (16) 3 | (26) 2 |
| (7) 2 | (17) 3 | (27) 3 |
| (8) 4 | (18) 2 | (28) 1 |
| (9) 1 | (19) 3 | (29) 4 |
| (10) 3 | (20) 2 | (30) 5 |

## B කොටස

31. 1. ආනුභවික පර්යේෂණ වීම.
    2. පර්යේෂණ වාස්තවික වීම.
    3. වටිනාකම් විනිශ්චයන්ගෙන් තොරවීම.

32. 1. සම්භාව්‍ය මාක්ස්වාදී අර්ථය
    2. සම්භාව්‍ය ලිබරල්වාදී අර්ථය
    3. සාංගමික ප්‍රජාතන්ත්‍රවාදී අර්ථය
    4. නව මාක්ස්වාදී ග්‍රාම්පියානු අර්ථය

33. 1. සාධනීය ගැටුම්
    2. නිශේධනීය ගැටුම්

34. 1. දාර්ශනික ඇහවීම 2. දේශපාලනික ඇහවීම

35. 1. අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමය
    2. සහසන්ධීය ආණ්ඩුක්‍රමය

36. 1. 1833 කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රමය
    2. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය


Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

37. 1. ප්‍රතිමානීය න්‍යාය
2. විද්‍යාත්මක න්‍යාය

38. 1. ජාතික - රාජ්‍ය ජාතිකවාදය
2. ජනවාර්ගික ජාතිකවාදය

39. 1. රාජ්‍ය තාන්ත්‍රික සබඳතා
2. විදේශාධාර
3. මිලිටරි බලය

40. 1. ලංකා සමසමාජ පක්ෂය
2. ලංකා කොමියුනිස්ට් පක්ෂය

41. 1. ශ්‍රේෂ්ඨාධිකරණය
2. ඔම්බුඩ්ස්මන්වරයා
3. මානව හිමිකම් කොමිසම

42. 1. රාජ්‍ය පරමෝත්තම වේ.
2. රාජ්‍ය සර්වබලධාරී වේ.

43. හම්සා අලාවි
2. චාල්ස් මොන්ටෙස්ක්‍යු

44. 1. ස්ත්‍රී පුරුෂ සමාජභාවය
2. ස්ත්‍රී පුරුෂ ශ්‍රම විභජනය
3. පීතෘ මූලිකත්වය
4. ස්ත්‍රී පීඩනය
5. පුරුෂ ආධිපත්‍යය

45. 1. ජනතා පරමාධිපත්‍යය
2. වරණයේ නිදහස
3. මහජනතාවට වගවීම
4. මහජන කැමැත්ත හා සුජාතභාවය

46. 1. ධූරාවලිය
2. ශ්‍රම විභජනය

47. 1. සෝල්බරි ව්‍යවස්ථාවේ පැවැති දුර්වලතා
2. ලංකාව සමූහාණ්ඩුවක් බවට පත් කිරීමේ අවශ්‍යතාව
3. රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා අධිකරණ සේවා කොමිෂන් සභාව සම්බන්ධයෙන් පැවති ගැටළු.

48. 1. සාර්ක් සංවිධානය
2. ආසියානු සංවිධානය

49. 1. මධ්‍යම ආණ්ඩුවේ උත්තරීතර බව.
2. අතිරේක ස්වාධිපති ආයතන ආණ්ඩුක්‍රමය තුළ නොමැති වීම.

50. 1. අන්තර් ප්‍රාන්ත වෙළඳාම
2. යුද්ධය ප්‍රකාශ කිරීම.
3. විදේශ සබඳතා
4. තැපැල් සේවය
5. මුදල්

PAST PAPERS WIKI
(11) WWW.PastPapers.WiKi (11)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!